# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 168/2024 (NPC)

පී.එම්.එම්.බී.යූ. ගල්වල
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.02.10**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක පී.එම්.එම්.බී.යූ.ගල්වල.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය නිලධාරී තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක මාලා බස්නායක මහත්මිය සමඟ නියෝජ්‍ය අධ්‍යක්ෂක ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

## -නියෝගය-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක 1990.05.19දින උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස පොලිස් සේවට බැදී ඇති අතර, 2003.01.01 දින පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා ඇත. පොලිස් පරීක්ෂක තනතුරේ සේවය කරන නිලධාරීන් සඳහා 2014 හා 2015 යන වර්ෂයන් හි සම්මුඛ පරීක්ෂණ පවත්වා, ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා දී ඇත. නමුත් අභියාචකට එරෙහිව මූලික විමර්ශනයක් පැවැත්වූ බැවින්, එම අවස්ථාවට ඉල්ලුම් කිරීමට අවස්ථාව සැළසී නැත. ඉන්පසුව 2019.07.01 හා 2020.01.01 දිනට දීර්ඝ සේවා පදනම පමණක් සළකා උසස්වීම් ලබා නැති නිලධාරීන්ට කාලීනව උසස්වීම් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව චක්‍රලේඛයක් නිකුත් කර ඇත. (ඇමුණුම් 03) අදාළ චක්‍රලේඛයට අනුව සුදුසුකම් සපුරා තිබූ තමාට එම අවස්ථාව නොලැබුණු බව අභියාචක ප්‍රකාශ කර සිටී. ඒ

පිළිබඳව සහනයක් ඉල්ලා අභියාචක 2023.04.20 දින ජාතික පොලිස් කොමිෂමට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව සළකා බැලූ ජාතික පොලිස් කොමිෂන් සභාව, 2024.03.06 දින අභියාචකට ද පිටපත් සහිතව, පොලිස්පති වෙත ලිපියක් යවමින් දන්වා ඇත්තේ, අදාළ අභියාචනය ප්‍රතික්ෂේප කරන බවයි. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක එම තීරණයට එරෙහිව මෙම විනිශ්චය අධිකාරයට 2024.04.02 වෙනි දින අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අදාළ අභියාචනය මගින් තමාගේ සියළු තොරතුරු සඳහන් කර, අවසන් ලෙස මෙම අධිකාරයෙන් අයදුම්කර සිටින්නේ,

I. මෙම අභියාචනය භාරගෙන එය විභාගය සඳහා නියම කරන ලෙසත්,

II. අභියාචනයේ මා දක්වා ඇති කරුණු අනුව පුරප්පාඩු නොසලකා දීර්ඝ කාලීනව උසස්වීම් නොලද නිලධාරීන්ට උසස්වීම් ලබාදීමට අමාත්‍ය මණ්ඩලය ගෙන ඇති තීරණය අනුව මා හටද 2020.01.01 වන දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර ලැබීමට හිමිකම ඇති බව නිගමනය කරන ලෙසත්,

III. ඒ අනුව මා 2020.01.01 වන දින සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ පිහිටුවන ලෙස නියෝග කරන ලෙසත්,

IV. උසස්වීම් ලබන දින සිට තනතුරට හිමි වැටුප් තලයේ පිහිටුවන ලෙස සහ එදින සිට මේ දක්වා හිඟ වැටුප් ගෙවීමට නියෝග කරන ලෙසත්,

V. ගරු පරිපාලන විනිශ්චය අධිකාරය සුදුසු යැයි සැලකන වෙනත් සහනයන් සහ ප්‍රධානයන් ලබාදෙන ලෙසත් ය.

මෙම කරුණු තවදුරටත් සනාථ කිරීම සඳහා විවෘත අධිකරණයේ දී කරුණු දක්වා සිටින ලද අතර. 2025.09.25 දින ලිඛිත නිරීක්ෂණ ද ඉදිරිපත් කර ඇත. අදාළ ලිපි ලේඛන සහ ඇමුණුම් මගින් කරුණු දක්වමින් අභියාචක දන්වා සිටින්නේ, අදාළ චක්‍රලේඛය අනුව සුදුසුකම් ලෙස පොලිස් පරීක්ෂක තනතුරේ වසර 12ක සේවා කාලයක් හා වැටුප් වර්ධක 10ක් උපයාගෙන ඇති බව සළකා බැලුවද, මේ දිනය වන විට අභියාචක වසර 16ක පොලිස් පරීක්ෂක තනතුරේ සේවය සපුරා ඇති බව සහ වැටුප් වර්ධක 10ක් උපයා ගෙන ඇති බැවින්, තමාට එම උසස්වීම ලබාදෙන ලෙසය.

මේ පිළිබඳව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2025.12.05 දින නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. අදාළ ලිපියේ II ඡේදයට අනුව,

I. අභියාචක 2012.03.01 දින සිට 2015.08.30 දක්වා වැටුප් රහිත නිවාඩු ලබා ඇත.

II. එසේම 2018.03.30 දින සිට 2021.03.30 දක්වා වසර 03ක නැවත වැටුප් රහිත නිවාඩු ලබා ඇත. එය අවසන් කර, නැවත සේවයට වාර්තා කර ඇත්තේ, 2021.05.03 දිනය.

අදාළ ලිපියේ පහත ජේද අනුව වැඩි දුරටත් පැහැදිලි කිරීම් කර ඇත.

"V. දීර්ඝ කාලීනව උසස්වීම් නොලබා සිටින පොලිස් නිලධාරීන් හට උසස්වීම් ලබාදීමේ යෝජනා වලියේ 03 වන අදියර යටතේ 2020.01.01 දිනට පොලිස් පරීක්ෂක තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරුට උසස්වීම් ලබා දීමේ දී පහත පරිදි මූලික සුදුසුකම් සලකා බලා ඇත.

- ❖ 2018.12.31 දිනට පොලිස් පරීක්ෂක තනතුරේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
- ❖ එම දිනට පොලිස් පරීක්ෂක තනතුරේ වැටුප් වර්ධක 10ක් උපයාගෙන තිබීම.
- ❖ 2018.12.31 පූර්වාසන්න වසර 03ක නොකැළැල් සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

VI. නිලධාරීන්ගේ වැටුප් රහිත නිවාඩු කාලය අඩු කිරීමෙන් පසු 2018.12.31 ට පොලිස් පරීක්ෂක තනතුරේ සක්‍රිය සේවා කාලය වසර 11 මාස 04 දින 27ක් බව හා වැටුප් වර්ධක 10ක් උපයාගෙන ඇති බව.

VII. එසේ වුවද 2018.03.30 සිට වැටුප් රහිත නිවාඩු ලබා තිබීම නිසා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති බව නිරීක්ෂණය වේ.

VIII. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 2009.02.20 පරිදි සතුටුදායක සේවාකාලය අර්ථ නිරූපනයේ දී නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන ඇති කාලය සතුටුදායක සේවා කාලය තුලට ගැනෙන බව දක්වා ඇත.

IX. ඒ අනුව මූලික සුදුසුකමක් ලෙස ඉල්ලා ඇති අවශ්‍යතාව ඉටු වී නොමැති බව."

මේ කරුණු සබැදිව අදාළ වන චක්‍රලේඛය (පී.3) පොලිස්පතිගේ අංක 636 කෙරේ අවධානය යොමු කරමු.

අදාළ චක්‍රලේඛයේ 02 ජේදය අනුව,

02. ඒ අනුව දීර්ඝ කාලීනව උසස්වීම් නොලබා සිටින පොලිස් නිලධරයන් හට උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයෙහි 02 වන අදියර 2019.07.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත්, 03 වන අදියර 2020.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

එම චක්‍රලේඛයේ මූලික සුදුසුකම් ලෙස,

03. මූලික සුදුසුකම් :-

i. තනතුර ස්ථිර කර තිබිය යුතුය.

ii. 2018.12.31 දිනට අදාළ තනතුරේ පහත වගුවෙහි සඳහන් සේවා කාලයක් සපුරා තිබිය යුතුයි. (තනතුරේ සේවා කාලය ගණනය කිරීමේ දී නිත්‍ය සේවා කාලය පමණක් ගණනය කල යුතු අතර, සේවයේ නොසිටි කාලයන්/වැටුප් රහිත නිවාඩු අඩු කිරීමෙන් පසුව සපුරාලිය යුතු සේවා කාලය ගණනය කළ යුතුයි.)

iii. එක් එක් තනතුරට අදාළව පහත වගුවෙහි සඳහන් අවම වැටුප් වර්ධක ප්‍රමාණයක් උපයා ගෙන තිබිය යුතුයි. (විශේෂ වැටුප් වර්ධක හැර)

iv. උසස්වීම් ලබන දිනට පෙර වූ ආසන්නම වසර 03ක කාලය තුල නොකැළැල් සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

එසේම එම චක්‍රලේඛයේ 4:1 ඡේදය හා 4:2 ඡේදය යටතේ වගු මගින් අදාළ තනතුරට සපුරාලිය යුතු සේවා කාලය සහ වැටුප් වර්ධක ප්‍රමාණයන් සඳහන් කර ඇත.

එම ලිපියෙහිම 05 ඡේදය යටතේ,

05. උක්ත උසස්වීම් ක්‍රමවේදය යටතේ උසස්වීම් ලැබීමට හිමිකම් ඇති ඔබ කොට්ඨාශයකට/ස්ථානයකට අනුයුක්තව රාජකාරී කරනු ලබන යම් නිලධරයෙකු, මේ වන විට සිටී නම්, වැඩ තහනම්ව සිටී නම්, විශ්‍රාම පූර්ව නිවාඩු හෝ විශේෂ රාජකාරී සඳහා පිටව ගොස් ඇත්නම් හෝ තාවකාලික අනුයුක්ත කර ඇත්නම්, එම නිලධරයන්ට වහාම මෙම පණිවුඩය දැනුම් දීමට කොට්ඨාශ භාර නිලධාරී/අධ්‍යක්ෂක/අණදෙණ නිලධාරී, හා මු.පො.ප/ස්ථානාධිපතිවරුන් විසින් කටයුතු කළ යුතුය.

යනුවෙන් සඳහන් කර ඇත.

3 හා 4 ජේද අනුව සුදුසුකම් සපුරා ඇත්නම් අදාළ ලිපියේ ඇමුණුම් 1 - 8 දක්වා ලේඛන අනුව සවයං ප්‍රකාශ කර ඉදිරිපත් කරන ලෙස 07 ජේදය මඟින් දැනුවත් කර ඇත.

07. මෙම දුරකථන පණිවිඩය අනුව උසස්වීම් ලැබීම සුදුසුකම් ලබන සියළුම නිලධරයන් 2020.02.25 දිනට පෙර ස්වයං ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. 2020.02.25 දිනට පෙර ස්වයං ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන නිලධරයන්ගේ උසස්වීම් යථා කාලයේ දි සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමි. එතෙක් එම නිලධරයන් උසස්වීම් ලැබීමට සුදුසුකම් නොලබනු ඇත.

අදාළ චක්‍රලේඛය අනුව අභියාචක විසින් 2022 සැප්තැම්බර් මාසයේ දී දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. අදාළ දිව්රුම් ප්‍රකාශයේ දී අභියාචක නොකැළැල් සේවා කාලය යන්න වෙනුවට නොකැළැල් කාලය යනුවෙන් සඳහන් කර ඉදිරිපත් කර ඇත. අභියාචක විසින් අදාළ චක්‍රලේඛයේ සඳහන් I, II, හා III යන කොන්දේසි සපුරා ඇත. IV ජේදයේ සඳහන් කොන්දේසි සපුරා නැත. වසර 03 නොකැළැල් සේවා කාලය යනුවෙන්,

2018.12.31

2015.12.31 අතර කාලය විය යුතුය.

අභියාචක 2015.12.31 සේවයේ නිරතව සිටියද, 2018.03.30 දින සිට වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත. ඒ අනුව අභියාචක නියමිත දිනට සපුරා ඇත්තේ, වසර 02 මාස 03 වැනි කාලයකි. නියමිත වසර 03 නොකැළැල් සේවා කාලයට මාස 09 පමණ අඩුවක් පවතී.

ඒ අනුව අදාළ උසස්වීම් ලැබීම සඳහා නියමිත එකී සුදුසුකමක් සපුරා නැත. අභියාචකට සහන සැලසීම සඳහා අභියාචක ප්‍රකාශ කරන පරිදි ඊට පෙර වසර 03ක සේවා කාලයක් සපුරා ඇති ද යන්න පරීක්ෂා කර බැලුවෙමු. අභියාචක පළමුවර විදේශ නිවාඩු ලබා ඇත්තේ, 2012.03.01 දින සිට වන අතර, 2015.08.30 දින දක්වාය. ඒ අනුව 2015.08.30 සිට, 2018.03.30 දක්වා සක්‍රිය සේවයේ නිරතව සිට ඇත. එම කාලය වසර 02 මාස 07ක පමණ කාලයකි. අනුව වසර 03 ක සක්‍රිය සේවා කාලයක් පෙන්වීම අපහසුය. ඒ අනුව පෙනී යන්නේ අදාළ චක්‍රලේඛයේ සඳහන් වසර 03ක නොකැළැල් සේවා කාලය කුමන ආකාරයෙන් හෝ මේ අභියාචක සපුරා නැති බවයි. අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරිපත් කර ඇති චක්‍රලේඛයේ IV වන කොන්දේසිය ඉටු කිරීමට අභියාචක අසමත් වී ඇත. ඒ

අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි මෙයට අදාළ චක්‍රලේඛයේ අදාළ සුදුසුකම් සියල්ල සපුරා ඇති බව ප්‍රකාශ කිරීමට නොහැක.

සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දි ජාතික පොලිස් කොමිෂන් සභාව ලබා දී ඇති නියෝගය නිවැරදි බව සනාථ වේ. ඒ අනුව අභියාචකගේ අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තිරණය කරමු.

මේ තීරණය අභියාචක, ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය ප්‍රතික්ෂේප කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-